# කොවිඩ් 19 ව්‍යාප්තිය වළක්වමින් පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සිදුකරන ආකාරය පිළිබඳව උපදෙස්

පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සඳහා උපදේශ සටහන් ලබා දී ඇත. සංචාරක සේවා, විශාල සාප්පු සංකීර්ණ, උත්සව කළමනාකරණය වැනි සමහර අංශවලට උපදෙස් සටහන් කිහිපයක් අදාළ වේ.

මෙම උපදෙස් කාර්යයන් නැවත ආරම්භ කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දී ඇති සමස්ත අවසරයට යටත් වේ (මුළුමනින්ම / තෝරාගත්).

සෑම උපදෙස් සටහනක්ම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබයි. COVID-19 සම්ප්‍රේෂණය වැළැක්වීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග ආයතන හිමිකරු / වගකිවයුතු පුද්ගලයා වෙත ඉදිරිපත් කර ඇත.

නව ජීවන රටාවක් උදෙසා
புதிய வாழ்க்கை முறையை நோக்கி
TOWARDS A NEW NORMAL

MINISTRY OF HEALTH AND INDIGENOUS MEDICAL SERVICES

World Health Organization

GOVERNMENT MEDICAL OFFICERS ASSOCIATION

SRI JAYAWARDENEPURA KOTTE MUNICIPAL COUNCIL

## 12.සන්නිවේදන / ඉලෙක්ට්‍රොනික සාප්පු

සන්නිවේදන / ඡායා පිටපත් සේවා සපයන ස්ථාන, ඉලෙක්ට්‍රොනික භාණ්ඩ අලෙවි කරන වෙළඳසැල්.

**නිශ්චිත පණිවිඩය / උපදෙස් (සාමාන්‍ය වෙළඳසැල් අනුගමනය කළ යුතු නිර්දේශයන්ම හා සමාන වේ)**

**සංවිධායක / හිමිකරු / සේවා යෝජකයා**

- හැකි තාක් දුරට දුරකථන සේවා ලබා නොදීමට සලකා බලන්න.
- ඔබ දුරකථන සේවා සපයන්නේ නම්, නියමිත ක්‍රමවේදයන්ට අනුව දුරකථන නිසි ලෙස විෂබීජහරණය කිරීමට වග බලා ගන්න.
- ඔබේ වෙළඳසැලේ (ඉලෙක්ට්‍රොනික සාප්පු සඳහා) ඇති භාණ්ඩ, උපකරණ ලැයිස්තුවක් ඔබේ වෙබ් අඩවියේ පල කරන්න. ඔබේ ගනුදෙනුකරුවන්ට දුරකථන ඇමතුම් හරහා තොග තිබේදැයි පරීක්ෂා කිරීමේ සේවාවක් සපයන්න.
- ක්‍රෙඩිට් කාඩ්පත් පාරිභෝගිකයින් විසින්ම කාඩ්පත් යන්ත්‍රයට ඇතුලත් කිරීමට අවශ්‍ය පහසුකම් සපයන්න.

**සාමාන්‍ය සාප්පු සඳහා නිර්දේශ**

- සෑම දිනකම මුහුණු ආවරණ, විෂබීජ නාශක වැනි අවශ්‍ය සැපයුම් ලබාගෙන අවශ්‍ය පරිදි අවම සේවක සංඛ්‍යාවක් තබා ගැනීමට සැලසුම් කරන්න.
- කාර්ය මණ්ඩලය පුද්ගලික ආරක්ෂාව ශක්තිමත් කළ යුතු අතර මුහුණු ආවරණපැළඳිය යුතුය. දෑත් පිරිසිදුව තබා ගන්න.කිවිසුම් යන විට මුඛය සහ නාසය ටිෂූ භාවිතයෙන් හෝ වැලමිටකින් ආවරණය කරන්න.
- දොරටුවේ උෂ්ණත්ව අධීක්ෂණ පද්ධතියක් සවිකල හැකිය.
- පුද්ගලයින් එකතුවීම පාලනය කිරීම සහ සාප්පුවේ සිටින ගනුදෙනුකරුවන්ගේ සංඛ්‍යාව අඩු කිරීම සඳහා සීමිත පිරිසකට පමණක් ඇතුළුවීමට ඉඩ දිය යුතුය. ඇතුල් වීමට අවසර දී ඇති ගණන ඇතුල්වීමේ දොරටුවේ ප්‍රදර්ශනය කළ යුතුය.
- හොඳින් වාතාශ්‍රය ලැබීමට; වායුසමීකරණ ක්‍රියාත්මක කිරීම හා නැවුම් වායු ප්‍රවාහය වැඩි කිරීමටඅවශ්‍යය.
- ගනුදෙනුකරුවන් නිතර ගැටෙන පෘෂ්ඨ භාණ්ඩ පිරිසිදු කර විෂබීජහරණය කරන්න.
- ගෙවීම් සහ පිටවීම් සඳහා පෝලිම්වල සිටින විට ආරක්ෂිත දුරක් තබා ගැනීමට ගනුදෙනුකරුවන්ට මතක් කර දීම සඳහා "මීටර 1 ක පරතරයක්" (මීටර 1 ක පරතරයකින් රැඳී සිටීමට) දැන්වීමක් සකස් කළ යුතුය.
- ලබා දී ඇති උපදෙස් වලට අනුකූල බව දක්වමින් ඔබ විසින් එකඟතා ප්‍රකාශය පිරවිය යුතුය. සම්පූර්ණ කරන ලද එකගතා ප්‍රකාශයේ මුල් පිටපත ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා වෙත යැවිය යුතුය. එහි පිටපතක් අදාළ පළාත් පාලන ආයතනයට (මහ නගර සභාව / නගර සභාව / ප්‍රාදේශීය සභාව) යැවිය යුතු අතර තවත් පිටපතක් තමන් සතුව තබා ගත යුතුය. ඉහත මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම අයිතිකරු / භාරකරුගේ වගකීම වේ.

**පරිශීලක / සේවාදායකයා**

- සාප්පුව තුළ ගත කරන කාලය අවම කිරීම සඳහා ඔබේ මිලදී ගන්නා භාණ්ඩය කල්තියා සැලසුම් කරන්න. හැකි නම් ඔබේ ලැයිස්තුව සූදානම් කිරීම සඳහා කල්තියාම භාණ්ඩ ලැයිස්තුව වෙළඳසැලට යවන්න.
- ක්‍රෙඩිට් කාඩ්පත යන්ත්‍රයට ඇතුලත් කිරීමට අයකැමිට භාර නොදී පාරිභෝගිකයා විසින් කළ යුතුය.
- හැකිතාක් භාණ්ඩ මිලදීගැනීම සඳහා සැමවිටම මාරු මුදල් රැගෙන යන්න.
- පෙරගෙවුම් ජංගම දුරකථන / දත්ත ගිණුම් නැවත පූරණය කිරීමට අන්තර්ජාල පහසුකම් භාවිතා කරන්න.
- සාප්පුව තුලදී හෙඩ්ෆෝන් අවශ්‍ය වන විට ඔබේ පුද්ගලික හෙඩ්ෆෝන් යුගලයක් භාවිතා කරන්න.

**නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වැඩපිළිවෙල**

- මෙම මාර්ගෝපදේශ ජාතික සෞඛ්‍ය බලධාරීන් විසින් ප්‍රකාශයට පත් කළ යුතු අතර, එය අනුමත කර අදාළ ජාතික හා පළාත් පාලන ආයතන විසින් නැවත ප්‍රතිස්ථාපනය කිරීමෙන් තවදුරටත් ශක්තිමත් කළ හැකිය.
- පෝස්ටර් සාප්පුවේ දොරටුවේ ප්‍රදර්ශනය කර තැබිය යුතුය.
- මෙය සමාජ මාධ්‍ය සහ ජනමාධ්‍ය හරහා මහජනයාට සන්නිවේදනය කළ යුතුය.



**සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්**

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.